මාධ්‍ය නිවේදනය

2021 පෙබරවාරි 15, කොළඹදී...

Nestlé
Good food, Good life

# නෙස්ටමෝල්ට්, 2021 වර්ෂය සඳහා SALARY for LIFE වැඩසටහන දියත් කරමින් දෙවැනි ජයග්‍රාහකයෙකුට වයස අවුරුදු 55 තෙක් මාසිකව රු. 50,000 බැගින් ප්‍රදානය කිරීමට සැරසෙයි

නෙස්ටමෝල්ට් ඉකුත් වසරේදී ආරම්භ කළ තම අසමසම ප්‍රවර්ධන වැඩසටහන වන 'SALARY for LIFE' වැඩසටහන දෙවැනි වරටත් සංවිධානය කරමින්, තරඟයේ කොන්දේසි හා නියමයන්ට අනුව, වයස අවුරුදු 55 සම්පූර්ණ වනතුරු මාසිකව රුපියල් 50,000 බැගින් ලබාගන්නා තවත් නෙස්ටමෝල්ට් පාරිභෝගිකයෙකු සොයාගැනීමේ මෙහෙයුම දැන් ආරම්භ කර තිබේ. මෙම වැඩසටහන දියත් කිරීම හරහා නෙස්ටමෝල්ට් අපේක්ෂා කරන්නේ, තමන්ට ළබැඳි පාරිභෝගිකයින්ට ඔවුන්ගේ ඉලක්ක ජයගනිමින්, ජීවිතයේ ඉහළට යාම සඳහා සවියක් වීම ය. වයස අවුරුදු 18ත් 50ත් අතර ඕනෑම නෙස්ටමෝල්ට් පාරිභෝගිකයෙකුට මෙම වැඩසටහනට එක්විය හැක. ඒ සඳහා ඔවුන් කළ යුත්තේ ග්‍රෑම් 400 නෙස්ටමෝල්ට් පැකට්ටුවක උඩු පියන්පත් හැකි තරම් ප්‍රමාණයක් යොමු කර කූපපත් ඇදීමේ තරඟයට ඇතුළු වීමයි. එවන ලද කූපපත් සියල්ල අතුරින් අහඹු ලෙස එක් ජයග්‍රාහකයෙකු තෝරා ගනු ලැබේ.

නෙස්ටමෝල්ට් ඉකුත් වසරේදී පළමු වරට සංවිධානය කළ SALARY for LIFE තරඟයෙන් ජයගැනීමට පිළිමතලාවේ පදිංචි 20 හැවිරිදි අවිශ්කා කොස්වත්ත මෙනෙවිය සමත්වූවාය. ඇය වසර 35ක් පුරාවට මාසිකව රුපියල් 50,000 බැගින් (තරඟයේ කොන්දේසි හා නියමයන්ට අනුව) හිමිකර ගනු ඇත. එම මුදල් තමන්ගේ වෘත්තීය ඉලක්කය වන ගුරුවරියක් වීමේ සිහිනය සැබෑ කරගැනීමටත්, තම පවුලට සහාය වීමටත් යොදාගැනීමට අවිශ්කා බලාපොරොත්තු වන්නීය.

"නෙස්ටමෝල්ට් SALARY for LIFE වැඩසටහන නිසා මගේ අනාගතය ගැන දැන් මට ලොකු විශ්වාසයක් තිබෙනවා. වසංගත කාලසමය නිසා ගුරුවරියක් ලෙස රාජකාරි ආරම්භ කිරීම තරමක් පමා වුණා. නමුත් නෙස්ටමෝල්ට් වෙතින් ලැබෙන මාසික දීමනාව නිසා ඉගෙනුම් කටයුතු අඛණ්ඩව කරගෙන යමින්, මගේ ඉලක්ක ජයගැනීමට මට හැකිවුණා. එසේ ලැබුණු මුදල්වලින් ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීමටත්, ඒ හරහා ඩිජිටල් අධ්‍යාපනය තුළින් අනාගත වෘත්තීය ජීවිතයේ සාර්ථකත්වය වෙනුවෙන් සූදානම් වීමටත් මට අවස්ථාව උදාවෙලා තිබෙනවා" යනුවෙන් අවිශ්කා පැවසුවාය.

"නෙස්ටමෝල්ට්, අවුරුදු 60කටත් වැඩි කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ පවුල් පරම්පරාවන්ට ධනාත්මක ආරම්භයක් ලබාදුන් සන්නාමයක්. අන් කිසිදු සන්නාමයක් නොකළ ආකාරයට, නෙස්ටමෝල්ට් 'SALARY for LIFE' තරඟය හරහා පාරිභෝගිකයන්ගේ ජීවිත තුළ ධනාත්මක වෙනසක් ඇති කරගැනීමට අපි ඔවුන් සවිබල ගන්වනවා. මෙම වැඩසටහන සඳහා පසුගිය වසරේදී නෙස්ටමෝල්ට් පාරිභෝගිකයින්ගෙන් විශාල ප්‍රතිචාර ප්‍රමාණයක් හිමිවුණා. එමනිසා අපි දෙවැනි වරටත් මෙම වැඩසටහන සංවිධානය කරන්නේ විශාල උනන්දුවකින් යුතුවයි. තවත් ලබැඳි නෙස්ටමෝල්ට් පාරිභෝගිකයෙකුට තමන්ගේ ඉලක්ක ජයගැනීම සඳහා සහාය වීමට අපි බලාපොරොත්තු වෙනවා" යනුවෙන් නෙස්ලේ උප සභාපති - කිරි ආහාර නිෂ්පාදන, රුවන් වැලිකල මහතා පැවසීය.

නෙස්ටමෝල්ට් යනු අඩ සියවසකට වැඩි කාලයක් මුළුල්ලේ සුවහසක් ශ්‍රී ලාංකික පවුල්වල විශ්වාසය දිනූ අසමසම නිෂ්පාදනයකි. මෙරට වැඩි දෙනෙකුගේ ආදරය හිමිකරගත් ප්‍රමුඛතම මෝල්ට් පානය වන නෙස්ටොමෝල්ට්හි, කිරි සහ මෝල්ට් සාරය මෙන්ම යකඩ, කැල්සියම් සහ විටමින් B2, B3, B6, B12, C සහ D වැනි පෝෂ්‍ය පදාර්ථ රැසක් ද අඩංගු වේ. එමගින් ශරීරයේත් මනසේත් ජවය වැඩි කරමින්, ප්‍රතිශක්තිකරණය ද ඉහළ නංවයි.